ජනාදරයට පාත්‍ර වූ තරු හෝ වෙනත් ප්‍රකට පුද්ගලයින් දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී, මාධ්‍ය වඩාත් ප්‍රවේශම් සහගත විය යුතු බව ඒ පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් පවසයි. ඊට හේතුව, වෙනත් පුද්ගලයන්ගේ දිවි තොර කරගැනීම් වලට වඩා, ජනප්‍රිය පුද්ගලයින්ගේ දිවි තොර කරගැනීම් වැඩි අවධානයක් ලබා ගැනීමත්, ඒ ඔස්සේ එවැනි දිවි තොර කරගැනීම් වඩාත් ඉහළ බලපෑමක් සිදු කිරීමටත් සමත් වීමයි. එවැනි දිවි තොර කරගැනීම් ඔස්සේද දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ ඉහළ ඉඩක් පවතී.

1) එවැනි අවස්ථාවකදීද පුවතට අත්‍යාවශ්‍ය නොවන්නේ නම්, දිවි තොර කරගත් ආකාරය ප්‍රමුඛත්වයෙන් යුතුව සඳහන් නොකොට සිටීම අත්‍යාවශ්‍ය වේ.

2) එසේම, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට මහෝපකාරී විය හැකි, හදිසි උපකාරක අංක සඳහන් කිරීමට කල්පනාකාරී වීමද අත්‍යාවශ්‍ය ව

මෙයට උදාහරණ ලෙස, ඇමරිකාවේ හිටපු රූ රැජිණක් ජීවිතයෙන් සමුගැනීමේ පුවතක් දේශීය හා විදේශීය පුවත් වාර්තාවන් හා දේශීය (දිවයින - පෙබරවාරි 1, 2022 , දෙරණ ජනවාරි 31, 2022) හා විදේශීය රූපවාහිනී පුවත් තුළත් වාර්තා වී ඇති ආකාරය දැක්විය හැක.

විදෙස් වාර්තාකරණයන්ට මෙතැනින් පිවිසෙන්න:
Good morning America: https://www.youtube.com/watch?v=fQWnE5h-7MI
BBC: https://www.bbc.com/news/world-us-canada-60173504

https://apnews.com/.../cheslie-kryst-dead...

ඒ අනුව, ඔබ වඩාත් යෝග්‍ය යැයි තෝරාගන්නේ පහත කුමන වාර්තාකරණයන් ද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://www.who.int/.../preven.../suicide/resource_media.pdf
https://cmhlp.org/.../Resource-2-SPIRIT-Media-Guidelines...